**ශීර්ෂය 265 - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/කච්චේරිය මන්නාරම පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර, 3 ඡේදයේ ශීර්ෂයට අදාළ විගණන නිරීක්ෂණ දැක්වේ.

**1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

(අ) මන්නාරම

(ආ) නානාටන්

(ඇ) මුසාලි

(ඈ) මාන්තයි බටහිර

(ඉ) මඩු

**1.1 විගණන විෂය පථය**

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 අගෝස්තු 25 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත . එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්ට හා අනෙකුත් ව්‍යවස්ථාපිත විධිවිධාන, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා

සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

#### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 291.55 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 257.88 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 33.67 ක් හෙවත් සියයට 12 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 170.60 | 158.76 | 11.84 | 7 |
| මූලධන | 120.95 | 99.12 | 21.83 | 18 |
| එකතුව | 291.55 | 257.88 | 33.67 | 12 |

#### (ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 19 ක් හා දෙපාර්තමේන්තු 16 ක් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත එකතුව රු. මිලියන 1,360.6 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් එකතුව රු. මිලියන 1,119.7 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

ඒ අනුව සළසා තිබුණු  ප්‍රතිපාදනයෙන් එකතුව රු. මිලියන 240.9 ක් හෙවත් සියයට 18 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම්

**රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනව තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම, වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 26501 | 12.00 | 11.30 | 6.00 | 8.61 | 50.00 | 38.10 |

## 2.3 අග්‍රිම ගිණුම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0283/0014/000 දරන අග්‍රිම ගිණුමේ රු. මිලියන 24.98 ක ශේෂයක් පැවතුණි.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට අංක 6003/0000/00/0041/0000/000 දරන තැන්පත් ගිණුමේ රු. මිලියන 98.73 ක ශේෂයක් පැවතුණි.

## 2.5 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3.1 සිට 3.10 දක්වා ඡේදවල සඳහන් කර ඇත.

## 3. ශීර්ෂය 265 - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/කච්චේරිය මන්නාරම

### 3.1 පොත්පත් හා ලේඛන පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් විගණන නියැදි පරික්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| පාඩු පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |
| බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| උප පත්‍රිකා ලේඛණය | මුදල් රෙගුලාසි 341 | විධිමත්ව පවත්වා නොතිබුණි. |
| විදුලි උපකරණ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 | විධිමත්ව පවත්වා නොතිබුණි. |

## 3.2 විසර්ජන ගිණුම

---------------

### 3.2.1 අයවැය විචලනය

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 03ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන උපයෝජනය පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 37 සිට සියයට 62 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) වැය විෂයය අංක 1401ට අදාලව සළසා තිබුණු රු.100,000ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

## 3.3 අග්‍රිම ගිණුම්

-------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0283/0014 දරන අග්‍රිම ගිණුමේ බැර ශේෂයක් නොතිබුණි. එසේ වුවද භාණ්ඩාගාර පොත් අනුව බැර ශේෂය රු.24,976,009 ක් විය. මෙම වෙනසට හේතු විගණනයට ඉදිරිපත් නොකරන ලදි.

## 3.4 පොදු තැන්පත් ගිණුම

---------------------------

වර්ෂ 2 ක් ඉක්ම වූ කල් ඉකුත් වූ එකතුව රු.2,839,458 ක තැන්පතු 22 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

---------------------------------------------

1998 වර්ෂයේ සිට පැවත එන මිය ගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය සහ වැඩ තහනම් කළ නිලධාරීන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,088,069 ක ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ **XXIV** පරිච්ඡේදයේ 4 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට හෝ ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.6 යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

------------------------------------

**විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මකකිරීම**

-----------------------------------------------------

2000 ජුනි 12 දිනැති අංක අයිඒඅයි/2000/01 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට වරක් හෝ පැවැත්විය යුතු වුවත් එවැනි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සමාලෝචිත වර්ෂයේදී තුන්වරක් පමණක් පවත්වා තිබුණි.

## 3.7 වත්කම් කළමනාකරණය

### (අ) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

පහත විග්‍රහ කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති බව විගණන නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක සංඛ්‍යාව | නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| මෝටර් රථ | 09 | වර්ෂ 03 |
| යතුරු පැදි | 02 | වර්ෂ 03 |
| වායු සමීකරණ යන්ත්‍ර | 03 | වර්ෂ 03 |

### (ආ) බාහිර පාර්ශව වෙත දී ඇති වත්කම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අවිධිමත් පරිදි වාහන 2ක් බාහිර පාර්ශව වෙත මුදා හැර තිබුණි. විස්තර පහත දැක්වේ.

| වාහන වර්ගය | වත්කම් ලබාදී ඇති බාහිර පාර්ශවය | කාලය |
|---|---|---|
| පිකප් රථ | ප්‍රාදේශීය සභාව, මන්නාරම | වර්ෂ 07 |
| පිකප් රථ | පළාත් තරුණ සේවා සභාව, මන්නාරම | වර්ෂ 04 |

## 3.8 අනුකූල නොවීම්

### නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති, හා රෙගුලාසිවල විධිවිධානයන්ට අනුකූල නොවීමේ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| (i) මුදල් රෙගුලාසි 94 | 512,177 | මූල්‍ය ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. |
| (ii)මුදල් රෙගුලාසි 136, 137, 138 සහ139 | 3,037,422 | ගනුදෙනු 23ක් සඳහා බලය දීම්, අනුමත කිරීම් සහ සහතික කිරීම් නොමැතිව ගෙවීම් සිදුකර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 | 65,000 | විවිධ කාර්යයන් කිහිපයක් සඳහා ලබාදුන් අත්තිකාරම් හතරක් අදාල කාර්යයන් කිසිවක් සිදුකිරීමකින් තොරව දින 58 ක සිට දින 94ක් දක්වා වූ කාල ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. |
| | 421,260 | ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම දින 25ක සිට දින 111ක් දක්වා වූ කාල ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. |
| | 618,000 | නිලධාරීන් 08 දෙනෙකු වෙත ඔවුන් විසින් කළින් ලබාගත් අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට පෙර අවස්ථා 57කදි නැවත වරක් අත්තිකාරම් මුදල් ගෙවා තිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 880 සහ 881 | 428,500 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක සේවයේ නිරත වී සිටින නිලධාරීන් 46 දෙනෙකුගෙන් දෙනෙකුගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 3.9 කළමනාකරණ දුර්වලතා

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2013 සහ 2014 වර්ෂවලදී සිදු කළ ඉදිකිරීම් වැඩ තුනක් සම්බන්ධයෙන් අයකිරීමට නියමිතව තිබූ ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ඉදිකිරීමේ නම | ඇස්තමේන්තුගත මුදල | නිම කළ යුතු දිනය | ප්‍රමාද කාලය | අයකළ යුතු ප්‍රමාද ගාස්තු මුදල |
|---|---|---|---|---|
| | රු. | | | රු. |
| මාරිච්චිකට්ටි හි පිහිටි අභ්‍යන්තර මාර්ගය | 7,587,132 | 2013.12.31 | මාස 08ක් සහ දින 10 | 758,713 |
| කරඩික්කුලි හි පිහිටි අභ්‍යන්තර මාර්ගය | 7,544,611 | 2013.12.31 | මාස 08ක් සහ දින 10 | 754,461 |
| පලක්කුලිහි පිහිටි අභ්‍යන්තර මාර්ගය | 7,625,729 | 2013.12.31 | මාස 11ක් සහ දින 20 | 762,573 |

## 3.10 මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2014 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදිවේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 22 | 18 | 04 | - |
| (ii) | තෘතියික මට්ටම | 17 | 01 | 16 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 349 | 264 | 85 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 56 | 37 | 19 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික) | - | 19 | - | 19 |
| | එකතුව | 444 | 339 | 124 | 19 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු 124ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

(ii) බඳවා ගෙන තිබුණු අනියම් හා තාවකාලික කාර්ය මණ්ඩලය වෙනුවෙන් විධිමත් අනුමැතියක් ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.